මෙම එක් එක් පාඨමාලාවන්ට ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් **2023.02.13** වන දින සිට **2023.03.10** දක්වා පෙ.ව 8.30ත් ප.ව 4.00ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ **විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය** වෙත පැමිණ රු.1,000.00 ක් ගෙවා (ආපසු නොගෙවන) ලබාගත හැකි ය. නැතහොත් **www.sab.ac.lk/codl** වෙබ් අඩවිය වෙත පිවිස අදාළ පාඨමාලාවේ අයදුම්පත හා බැංකු ගෙවීමේ රිසිට්පත බාගත කර ගත හැකි ය. තවද අයදුම්පත්‍ර ගාස්තුව වන රු. 1,000.00 ක මුදලක් (ආපසු නො ගෙවන) ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ගිණුම් අංක **"0002246875"** ට අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ පාඨමාලාවේ නම නිවැරදි ව දක්වමින් බැර කළ යුතු ය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත, බැංකු ගෙවීම් රිසිට්පත හා පහත සඳහන් ලේඛනයන්හි **සහතික කළ පිටපත්** සමඟ **අධ්‍යක්ෂ,විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ.02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය
2. සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය /ලිපියක් (අධ්‍යාපන හෝ වෙනත්)
3. ජාතික හැඳුනුම්පත

**එක් අයදුම්පතක් වලංගු වන්නේ එක් පාඨමාලාවකට අයදුම් කිරීම සඳහා පමණි. අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු අතුළත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි ය. ඉහත සඳහන් සියලු ම පාඨමාලාවලට අදාළ දේශන හා විභාග පැවැත්වීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයෙහි දී සහ මාර්ගගත ක්‍රමයට (Online) පමණක් සිදු කෙරේ.**

**වැඩි විස්තර සඳහා විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ දුරකථන අංක 045-2280179 අමතන්න.**

***සැළකිය යුතුයි:**

**ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව හා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශේෂ කොන්දේසි**

මෙම ඉංග්‍රීසි පාඨමාලාවන් සඳහා අයදුම්පත් නිකුත් කිරීම හා බඳවා ගැනීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙහි දී පමණක් **2023.02.13** දින සිට **2023.03.10** දින දක්වා ලියාපදිංචි වීමේ ප්‍රමුඛතාව මත සිදු කෙරේ. තව ද සීමිත සිසුන් සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් නියමිත සිසුන් සංඛ්‍යාව සම්පූර්ණ වූ පසු ලියාපදිංචි කිරීම අවසන් විය හැකි ය. එබැවින් මෙම පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලි හා මුදල් රැගෙන **2023.02.13** වන දින සිට **2023.03.10** අතර කාලය තුළ **සතියේ දිනවල පමණක්** පෙ.ව 8.30 ත් ප.ව 3.00 ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය වෙත පැමිණ ලියාපදිංචි විය යුතු ය.

**රැගෙන ආයුතු ලියකියවිලි (මුල් පිටපත හා ඡායා පිටපතක් අවශ්‍ය වේ)**

1. උප්පැන්න සහතිකය
2. හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාවට අදාළ ව සම්පූර්ණ කළ සුදුසුකම් සපුරා ඇති අධ්‍යාපන සහතික අනිවාර්යවේ. (ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ (CCE) සහතික රැගෙන ආ යුතුයි.)
3. ජාතික හැඳුනුම්පත
4. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02 ක්
5. අයදුම්පත් ගාස්තුව රු.1,000.00
6. පාඨමාලා ගාස්තු (ඉහත සඳහන් පරිදි)

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2023.02.12

වැඩි විස්තර : විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංක: 045-2280179